
WWW.OLEVELAPI.COM

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2013

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# උත්තරපත්‍ර ලකුණු කිරීම පොදු ශිල්පීය ක්‍රම

පිළිතුරු පත් ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

❖ උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

❖ සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉක්කම්න්** ලියන්න.

❖ ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

## බහුවරණ උත්තරපත්‍ර (කවුළු පත්‍රය)

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන / අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී එය නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා :- (60/100) (20/30)

## ව්‍යුහගත රචනා හා රචනා උත්තර පත්‍ර

WWW.OLEVELAPI.COM

❖ අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති කොටස් හෝ පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

❖ ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතුවේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්න පත්‍ර එකකට (ප්‍රශ්න පත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) පමණක් පෙනී සිටි අවස්ථාවක දී ඉතිරි ප්‍රශ්න පත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රයන්ට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතුය.

උදාහරණ :- මුළු ලකුණු 100



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

| අවසාන ලකුණු | මූළු ලකුණු | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මූළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා :

කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ අදාළ උත්තර පත්‍ර පැකට්ටුව I හා II සියල්ල ම ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.
(උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.)
කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍ර I හෝ II හෝ III පැකට්ටුව තුළ නොමැති අවස්ථාවක දී හා ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවනට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

උදා - ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවල දී**

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා "අවසාන ලකුණු තීරණය කළ නොහැක" යන සටහන යොදන්න. මෙම සටහන උත්තර පත්‍රයේ මුල් පිටුවේ පහළ කෙලවරේ ද යොදන්න. මේ පිළිබඳව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් "9" අයිඑම්එල් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු "9" අයිඑම්එල් (9IML) කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

WWW.OLEVELAPI.COM

කොටස් සඳහා දෙන ලකුණු ඒ ඒ කොටස අවසානයේ භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න. උත්තරයකට ලැබුණු මුළු ලකුණු ලිවීමේ දී එක් එක් කොටස සඳහා ලැබුණු ලකුණු උත්තරය අවසානයේ නැවත ලියා ඒවා එකතු කොට දක්වා ඒ වටා කවයක් අඳින්න. නිදසුනක් වශයෙන් ප්‍රශ්න අංක 03 කොටස් තුනකින් යුක්ත නම් හා එක් එක් කොටසට හිමි උපරිම ලකුණු ප්‍රමාණය 05 නම්, ඒ අනුව අයදුම්කරු ලබා ඇති ලකුණු මෙසේ දැක්විය යුතුය.

$$\text{i}\ \frac{4}{5} + \text{ii}\ \frac{3}{5} + \text{iii}\ \frac{3}{5} = 3 \text{ ——— } \left(\frac{10}{15}\right)$$

සෑම උත්තරයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියල්ල ම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහනක් කර අවසානයේ දී අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමානදැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න.
(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශත සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

## අවසාන ලකුණු තීරණය කිරීම

දින පැකැට්ටුවට අදාල සියලු ම උත්තර පත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තර පත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :-

| (අ) | | (ආ) | | (ඉ) | |
|---|---|---|---|---|---|
| (i) | $\frac{54}{100}$ | (i) | $\frac{22}{40}$ | (i) | $\frac{60.5}{100}$ |
| (ii) | $\frac{67}{100}$ | (i) | $\frac{34}{60}$ | (i) | $\frac{81}{100}$ |
| (iii) | $\frac{36}{100}$ | | | | |
| 3 | 157 | | | 2 | 141.5 |
| | 52.33 | | | | 70.75 |
| | 52% | | 56% | | 71% |

ඉහත උදාහරණවලින් දැක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යා ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 05 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණ විය යුතුය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතුය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

# අ.පෙ.ස. (සා.පෙළ) විභාගය - 2013

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය I,II,III

## අවසාන ලකුණු ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| I | පත්‍රය | | ලකුණු 40 යි |
| II | 1 වන ප්‍රශ්නය | ලකුණු 20 යි | |
| | 2 වන ප්‍රශ්නය | ලකුණු 25 යි. | |
| | 3 වන ප්‍රශ්නය | ලකුණු 10 යි. | |
| | 4 වන ප්‍රශ්නය | ලකුණු 10 යි. | |
| | 5 වන ප්‍රශ්නය | ලකුණු 15 යි. | ලකුණු 80 යි |

III 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්යයි. 5, 6, සහ 7 වන ප්‍රශ්නවලින් එකකට පිළිතුරු ලිවිය යුතුයි.

| | | |
|---|---|---|
| 1 වන ප්‍රශ්නය | ලකුණු 20 යි | |
| 2 වන ප්‍රශ්නය | ලකුණු 20 යි. | |
| 3 වන ප්‍රශ්නය | ලකුණු 15 යි. | |
| 4 වන ප්‍රශ්නය | ලකුණු 15 යි. | |
| 5 වන ප්‍රශ්නය | ලකුණු 10 යි. | |
| 6 වන ප්‍රශ්නය | ලකුණු 10 යි. | |
| 7 වන ප්‍රශ්නය | ලකුණු 10 යි. | ලකුණු 80 යි |

එකතුව ලකුණු $\frac{200}{2}$ යි

**අවසාන ලකුණු 100**

WWW.OLEVELAPI.COM

### දෙවන හා තුන්වන පත්‍රවල ලකුණු දැමීම

1. කොටස් ලකුණු දකුණු පස ඇති තීරුවේ ලියා දක්වන්න.

2. ඒ ඒ ප්‍රශ්නයේ කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න

උදා : $\frac{4}{8}$ $\frac{6}{12}$ $\frac{3}{5}$ (2 = $\frac{13}{25}$)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**අවසාන ලකුණු ඇතුළත් කිරීම**

රතු ලකුණු ලැයිස්තු යොදා ගන්නා විට එහි දැක්වෙන මුළු ලකුණු වන 300 යන්න වෙනස් කොට 200 සේ ලියා ගන්න.

**රතු ලකුණු ලැයිස්තු නොමැති විට අවසාන ලකුණු ඇතුළත් කිරීම.**

I, II පත්‍රවල ලකුණු ඇතුළත් කිරීම සඳහා යොදා ගත යුත්තේ තුන්වන පත්‍රය සඳහා ඇති ලකුණු ලැයිස්තුව ය.

ලකුණු ලැයිස්තුවේ දැක්වෙන අංක 12 තීරුව 3 වන පත්‍රයේ මුළු ලකුණු ලණන ඇතුළත් කිරීමට යොදා ගන්න. පත්‍ර තුනෙහි ම ලකුණුවල එකතුව එහි මුළු ලකුණු (200) තිරුවේ ද අවසාන ලකුණු (100) තීරුවේ ද සටහන් කරන්න.

**විශේෂ අවස්ථා**

III පත්‍රය සඳහා ලකුණු ලැයිස්තු සපයා නොමැති නම් ඇගයීම් මධ්‍යස්ථානයෙන් අතිරේක ලකුණු ලැයිස්තු ලබාගෙන III පත්‍රයේ ලකුණු එහි ඇතුළත් කරන්න.

එවැනි අවස්ථාවල දී I, III පත්‍රවල මුළු ලකුණු II පත්‍රය සඳහා ඇති විස්තර ලකුණු ලැයිස්තුවේ ඇතුළ්කොට අවසාන ලකුණු ගණන 100 තීරුවේ ලියන්න.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. ලකුණු කිරීම සඳහා ඔබ පිළියෙල කර ගන්නා කවුළුපත ප්‍රධාන පරීක්ෂක ලවා සහතික කරවා ගන්න.

2. පළමුවෙන් ම උත්තර පත්‍රය පරීක්ෂා කර එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු එකකට වඩා ලකුණු කොට ඇත්නම් හෝ ලකුණු කොට නැත්නම් වරණ හතර කැපී යන සේ ඉරක් අඳින්න.

3. සෑම උත්තරයක් ම හරි බව හෝ වැරදි බව හෝ පැහැදිලිව ම අදාළ ප්‍රශ්න අංකය මත ම ලකුණු කරන්න.

4. අපේක්ෂකයා ලකුණු කර ඇති පිළිතුරු මත හරි වැරදි (✓, ✗) ලකුණු නොදමන්න.

5. කවුළු පතේ ප්‍රශ්න අංක තීරය කවුළුවක් වන සේ කපා හැර එම තීරුවෙහි ම හරි වැරදි බව දක්වන්න.

6. කවුළු පතක් හෝ තීරු පතක් හෝ යොදා ගන්නා විට නිවැරදි සීහුම ගැන විශේෂයෙන් පරිස්සම් වන්න.

7. එක් එක් තීරුවේ නිවැරදි උත්තර සංඛ්‍යාව පහළට එකතුකොට ඒ ඒ තීරුවේ ම යටින් ලියා ඒවා එකතු නිවැරදි ගණන $\frac{XX}{40}$ යි. දකුණුපස අදාළ කොටුව තුළ ලියන්න.

8. ලකුණු එකතු කිරීම, එම මුළු ලකුණු වන III වන පත්‍රයේ සටහන් කිරීම යන අවස්ථාවල දී බෙහෙවින් පරීක්ෂාකාරී වන්න.

9. ආදී ලකුණකින් උත්ත ලකුණු කර තිබුණ ද, උත්තර දීම සඳහා විශේෂ පත්‍රිකාව භාවිත නොකොට ප්‍රශ්න පත්‍රයෙහි ම ඉරි ඇඳීම ආදී වශයෙන් ලකුණු කොට තිබුණ ද පිළිගන්න.

# II, III පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. උත්තරපත්‍ර ඇගයීම ආරම්භ කිරීමට පෙර එක් එක් ප්‍රශ්නයකින් තක්සේරු කිරීමට අපේක්ෂා කරන හැකියාව කවරේ දැයි හොඳින් අවබෝධ කර ගත යුතුය.

2. එම හැකියා සම්බන්ධයෙන් අපේක්ෂකයා ප්‍රදර්ශනය කළයුතු ප්‍රවීණතා මට්ටම කුමක් ද යන්න අනුහුරු අභ්‍යාස කිරීමේ අවස්ථාවේදීත් ලකුණු දීමේ පටිපාටිය සාකච්ඡා කරන අවස්ථාවේදීත් පැහැදිලිව හඳුනා ගැනීම අවශ්‍ය වේ. මෙහි දී ප්‍රදර්ශනය විය යුත්තේ 11 වන ශ්‍රේණියේ අවසානයේ දී අපේක්ෂකයා ළඟා විය යුතු ප්‍රාප්ති මට්ටම් ය. එහි දී ගුරුවරයෙකු වශයෙන් ඔබ සතු අත්දැකීම් ද ඔබගේ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් දෙනු ලබන උපසෙද් හා මග පෙන්වීම ද බොහෝසේ ප්‍රයෝජනවත් වනු ඇත.

WWW.OLEVELAPI.COM

3. ලකුණු පැවරීමේ දී පරීක්ෂකවරුන් අතර සංගත බවක් තිබිය යුතුය. එකම උත්තරයකට පරීක්ෂකවරුන් කිහිප දෙනෙකු විසින් පවරනු ලබන ලකුණු අතර විශාල වෙනස්වීම ඇතිවීම වළක්වා ගත යුතුය. මේ සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කිරීම මැනවි.

   (අ) ඉදිරිපත් කොට ඇති ලකුණු දීමේ පටිපාටිය එලෙස ම අනුගමනය කිරීම.

   (ආ) ප්‍රධාන පරීක්ෂකගේ උපදෙස් නිවැරදි ව වටහා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම.

   (ඇ) විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති අත් පොතෙහි සඳහන් ශිල්පීය ක්‍රම ඒ අයුරින් ම භාවිත කිරීම.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / Department of Examinations, Sri Lanka

**21 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2013

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය I,II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் I,II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature I,II | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. **අත හයිය නම් බත නොවරදින** බව පැවසුවෝ පුරාණ පඬිවරු ය.
   (1) සිහමන් ඉල්ලීමෙන් ආහාර ලැබෙන බව
   (2) කුඹුරු කෙටූ කල බත් ලැබෙන බව
   (3) වැඩ කිරීමෙන් ලාභ උපයාගත හැකි බව
   (4) උත්සාහය ඇත්නම් ජයගත හැකි බව

2. තම මිතුරාගේ **බත්පතට වැලි දැමීම** නොකළ යුතුව තිබුණු දෙයක් බව ඔහුට අවබෝධ වන විට බොහෝ කල් ඉකුත්ව තිබුණේ ය.
   (1) ආහාරය අනුභව කළ නොහැකි තත්ත්වයට පත් කිරීම
   (2) ලැබෙන්නට ගිය ලාභයට හානි කිරීම
   (3) අපහසුතාවට පත් කිරීම
   (4) කළ උපකාර අමතක කර දැමීම

3. අකලංකට **සෙනසුරා ලබා** ඇතැයි ඔහුගේ මිතුරෝ පවසති.
   (1) යහපත් කාලයක් උදා වී
   (2) මංගල යෝජනාවක් ලැබී
   (3) අයහපත් කාලයක් උදා වී
   (4) මානසික කම්පනයට පත් වී

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. අන් අයගේ අදහස්වලට සවන් නොදී ..................... ක්‍රියා කිරීම යහපත් ගුණාංගයක් නො වේ.
   (1) අත්තනෝමතික ව
   (2) පරාර්ථකාමී ව
   (3) නිද්‍රාශීලී ව
   (4) ඊර්ෂ්‍යාපරවශ ව

5. ගරු මර්සිලින් ජයකොඩි පියතුමා සියලු දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූ ..................... කිතුනු පියතුමෙකි.
   (1) අනභිභවනීය
   (2) සම්මානනීය
   (3) ප්‍රහර්ෂණීය
   (4) අභිරමණීය

6. සාහිත්‍ය පොතපතට ..................... වුණු පුද්ගලයා දැනුම් කෝෂ්ඨාගාරයකි.
   (1) ආසක්ත
   (2) විනිර්මුක්ත
   (3) වියුක්ත
   (4) සංයුක්ත

7. අකාරාදී පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) නිලය, නිවටයා, නිවස, නිර්මල
   (2) කැලෙ, කැටුම්, කැපීම, කැලය
   (3) පදය, පදිංචිය, පහන, පරතරය
   (4) විධානය, විනය, විනීත, විපරම



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

8. අර්ථ හීන කොටසක් සහිත යුගල පදයක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
   (1) වට්ටිපෙට්ටි රැගෙන සියල්ලෝ ම වාහනයට නැග ගත්හ.
   (2) වැඩිපුර මුදල්හදල් ඇති අයට කරදර ද වැඩි ය.
   (3) හොඳ සිරිත්විරිත් පුරුදු කිරීම යහපත් දරුවන්ගේ ලක්ෂණයකි.
   (4) පොතපත කියවීමෙන් ඥානය වැඩි වේ.

9. ඉස්පිල්ල, පාපිල්ල, ඇදය සහ ඇලපිල්ල යන **පිල්ලම්** පිළිවෙළින් **නිවැරදි ව** යෙදී ඇති වචන පේළිය තෝරන්න.
   (1) චින්තනය, සරුංගලය, කාලය, නැව
   (2) කිරි, තුල්‍ය, පැහැපත්, සාරවත්
   (3) සිසිල, රුවල, කාලය, භාවනාව
   (4) විස්තෘත, නුවණ, තරුව, සැපවත්

- අංක **10** සහ **11** ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති වරණය තෝරන්න.

10. (1) ත්‍යාග ප්‍රධානය; දිලිඳු, පිළියෙල, ඥාණය
   (2) ජනගහණය, ස්ථිරසාර, අධිගෘහීත, නිළඹර
   (3) අබිෂේක, පිළිසකර, වැඩමුලුව, ළෙන්ගතු
   (4) ප්‍රාර්ථනාර්ථය, නිශ්චල, කනිෂ්ඨ, ජ්‍යොතිශ්ශාස්ත්‍රය

11. (1) අභිවෘද්ධිය, මාධුර්‍යය, ළැදියාව, පිළිබිඹුව
   (2) පසලොස්වක, ප්‍රත්‍යක්ෂ, ශාස්ත්‍රධරත්වය, අභිලාෂය
   (3) දෘෂ්ටිගෝචර, ධර්මිෂ්ට, ඓක්‍යය, ව්‍යවස්තාව
   (4) පරිකථා, අත්‍යුත්කර්ෂවත්, භක්ත්‍යාධරය, ව්‍යංගාර්ථය

12. විරාම ලකුණු නිවැරදි ව යෙදූණු වාක්‍යය තෝරන්න.
   (1) කුඩා ව්‍යාපාර සඳහා, බැංකු පහසුකම් ලබා දෙමු!
   (2) පැ:ව: 3.00 ට රැස්වීම, පැවැත්වෙන බව, සභාපතිතුමා දැන්වී ය.
   (3) අහෝ ?ඔහුට යන්න; කියන්න!
   (4) 'පුලතිසිපුර' යනු පොළොන්නරුවට අතීතයේ යෙදූණු නාමය යි.

13. **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) අශ්ව - තුරඟ, ගජ, හය, සෛන්ධව
   (2) ස්වර්ණ - හේම, කාංචන, රන්, කනක
   (3) ලෝකය - ජගත්, දිය, ලෝ, ලෙව්
   (4) සඳ - සිසි, කලාපති, සොම්, හිමකර

14. **විරුද්ධාර්ථයක් දෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
   (1) ප්‍රවීණ - ඡේක, දක්ෂ, නිපුණ, විචක්ෂණ
   (2) නිර - අචල, නිසල, නිශ්චල, නොසැලෙන
   (3) අඥාන - දද, මුග්ධ, විදග්ධ, මූඪ
   (4) දිශාව - පාර්ශ්වය, දිග, පස, දෙස

- අංක **15** සිට **18** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

15. ජනතාවක් සතු ගීත කලාවක් තිබීමෙන් **ගම්‍යමාන වන්නේ** ඔවුන් සතුව ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් තිබූ බවයි.
   (1) හැඟෙන්නේ (2) උත්පාදනය වන්නේ (3) දෘශ්‍යමාන වන්නේ (4) ඉස්මතු වන්නේ

16. ඉකුත් දශක දෙක තුළ සිංහල ගීතය **භාවපූර්ණ** සුනිශිත සාහිත්‍ය නිර්මාණයක් බවට පත් විය.
   (1) අර්ථ සපිරුණු (2) හැඟීම්වලින් සපිරුණු (3) රසයෙන් සපිරුණු (4) ශබ්ද හා අර්ථවලින් සපිරුණු

17. ඔහු ඉදිරිපත් කළේ **ප්‍රතිෂ්ඨා විරහිත** කරුණු සමුදායකි.
   (1) හේතු සාධක නොමැති
   (2) විශ්වාස කළ නොහැකි
   (3) අදාළ නැති
   (4) ප්‍රත්‍යක්ෂ නැති

18. ලංකාවේ **පුරාකෘත** නිර්මාණ අභිමානවත් ඉතිහාසයකට සාක්ෂි සපයයි.
   (1) කෘතිවලින් පිරුණු (2) ඓතිහාසික (3) පෙර කරන ලද (4) පුරා විද්‍යාත්මක

- අංක **19** ප්‍රශ්නයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස වෙනුවට යෙදිය හැකි වඩාත් ගැළපෙන තනි පදය තෝරන්න.

19. ශ්‍රමදානය සඳහා ගම්වැසියන් එකතු වූයේ **කිසිවකුගේ බල කිරීමකින් තොරව** ය.
   (1) ස්වෝත්සාහයෙන් (2) ස්වේච්ඡාවෙන් (3) පරාර්ථකාමීත්වයෙන් (4) නිරායාසයෙන්

20. 'අතීතයේ සිට ම බොහෝ පිරිස් දේශගවේෂණයේ යෙදී ඇති බව ඓතිහාසික මූලාශ්‍රය සාක්ෂි දරයි' යන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදය වන්නේ
   (1) අතීතයේ (2) දේශගවේෂණයේ (3) ඓතිහාසික (4) සාක්ෂි

[ හත්වැනි පිටුව බලන්න.



WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

21. වැරදි අදහස දෙන වරණය තෝරන්න.
(1) 'දුශ්චරිත' යන වචනයේ 'දුශ්' යනු උපසර්ගයකි.
(2) 'යළි' යනු අවධාරණාර්ථයේ නිපාත පදයකි.
(3) පංකජ යනු නෙළුම්මලට පර්යාය පදයකි.
(4) ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය කොළඹ දී විවෘත කෙරෙයි යනු කර්ම කාරක වාක්‍යයකි.

22. 'නටයි' යන ක්‍රියා පදයේ **උත්තම පුරුෂ, අතීත කාල, බහු වචන** රූපය ඇතුළත් වරණය තෝරන්න.
(1) නැටීය (2) නැටූහ (3) නැටූහු (4) නැටූමු

23. 'වහා එන්න' යන වාක්‍යයේ 'වහා' යනු
(1) ක්‍රියා විශේෂණ නිපාතයකි.
(2) සීමාව හැඟවීමේ නිපාතයකි.
(3) ආමන්ත්‍රණය හඟවන නිපාතයකි.
(4) පද සම්බන්ධ කිරීමේ නිපාතයකි.

24. 'සුම්හිරි' යන පදයේ 'සු' යන උපසර්ගය
(1) පදයේ අර්ථය වෙනස් කරයි.
(2) පදයට විරුද්ධ අර්ථයක් ගෙන දෙයි.
(3) පදයේ අර්ථය අනුව ම පවතී.
(4) පදයේ අර්ථය වැඩි කරයි.

25. මුලින් දැක්වෙන පදය නිවැරදි ලෙස **විසන්ධි** කර ඇති වරණය තෝරන්න.
(1) අත්‍යන්ත - අති + අන්ත
(2) බුදුකුරු - බුදු + කුරු
(3) මිහින්තල - මිහින් + තල
(4) අත්‍යවශ්‍යතාව - අත්‍ය + අවශ්‍යතාව

- අංක **26** සිට **28** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න,

26. නිෂ්ඵල උත්සාහයක් දැරීම
(1) කතාව දෝලාවෙන් ගමන පයින්
(2) බීරි අලින්ට වීණා ගායනා කිරීම
(3) විද්දේ හාවට වැදුණේ පඳුරට
(4) වත්ත බද්දට දී ඇස්සට දත නියවීම

27. යම් කාර්යයක් ඕනෑවට එපාවට කිරීම
(1) මෝල්ගස් ගිලපු පිඹුරා වගේ
(2) උගුඩුවා ඇටි කෙහෙල් කෑවා වගේ
(3) ලෙඩ කපුටා වැල කනවා වගේ
(4) හිඟන්නගේ පාත්තරේ හෙනහුරා වැටුණා වගේ

28. අකැමැත්තෙන් යම්කිසි කාර්යයක් සිදු කිරීම
(1) ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනවා වගේ
(2) අකු කඩා මොර කන්නා වගේ
(3) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ
(4) උගුරට හොරා බේත් කනවා වගේ

- අංක **29** සිට **31** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) පොත් කියවන්නෝ ලෝකය දිනන්නෝ ය.
(2) ඔහු දක්ෂ ඉංජිනේරුවකු වෙයි.
(3) දිරිය දරුවන් සැමගේ ප්‍රශංසාව ලබයි.
(4) ධාරානිපාත වර්ෂාවත් සමඟ ජලාශයෝ පිරී ඉතිරී යයි.

30. (1) මා මිතුරන් හෙවත් ඔවුහු මට උදව් කරති.
(2) සියලු මිනිස්සු යහපත් පුද්ගලයෝ ද?
(3) පෙදරේරුවෝ ගොඩනැගිල්ල නිමා කරාවි.
(4) පාරේ වැඩට කම්කරුවෝ පැමිණ ඇත.

31. (1) පියා නොහොත් මම මංගල උත්සවයට සහභාගි වන්නෙමු.
(2) පාසල් ළමයින් සඳහා ලියවුණු පොත් රාශියක් ඇත.
(3) දක්ෂ ලේඛිකාවක් වන්නේ කෙසේ ද?
(4) නාවිකයෝ වෙරළට පැමිණෙනු ඇත.

32. තරුපති යන පදය අයත් වන්නේ,
(1) අව්‍යය සමාසයටයි
(2) විශේෂණ සමාසයටයි
(3) විභක්ති සමාසයටයි
(4) අන්‍යාර්ථ සමාසයටයි

33. උපමාවක් ඇතුළත් කවි පදය තෝරන්න.
(1) ලෙළ දුන් නව තඹ පලු වන් නාදේ
(2) සබමින් නිවරද මද්දල නාදේ
(3) ගයමින් පාන ගීයෙන් කීදේ
(4) අහනන් රහ දුටුවන් සිත පැදේ

[ දහවැනි පිටුව බලන්න



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

34. නූතන ජනගහන වර්ධන වේගය අනුව පෘථිවි තලය මත ඇති ආහාර නිෂ්පාදන ශක්තිය කොතෙක් දුරට ඔරොත්තු දේ දැයි යන්න ලෝපුරා විශේෂඥයින්ගේ හිස අවුල් කරවන ගැටලුවක් බවට පත් වී ඇත.
   (1) ජනගහන වර්ධන වේගය ගැන සලකන විට පෘථිවියේ ඇති ආහාර නිපදවීමේ හැකියාව ඊට සෑහේ ද යන්න ලෝපුරා විශේෂඥයින්ගේ හිස අවුල් කරවන ගැටලුවක් බවට පත් වී ඇත.
   (2) ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව මහපොළොව සතු ආහාර නිපදවීමේ හැකියාව අඩු වීම ලෝපුරා සිටින විශේෂඥයින්ගේ සුවිශේෂ අවධානය යොමු වී ඇති කරුණකි.
   (3) ජනගහන වර්ධන වේගයත් සමඟ මහපොළොවේ ආහාර නිපදවීමේ හැකියාව අඩු වීමෙන් ඇති වන ආහාර හිඟය ලෝපුරා සිටින විශේෂඥයින්ගේ අවධානය යොමු වී ඇති කරුණකි.
   (4) ජනගහන වර්ධන වේගයට සමාන්තරව මහපොළොවේ ආහාර නිපදවීමේ හැකියාව අඩුවීමෙන් ඇති වන ආහාර හිඟය පිළිබඳ ව ලෝපුරා සිටින විද්‍යාඥයින්ගේ අවධානය යොමු වී ඇත.

35. ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂණය කිරීම සඳහා වී වගාවට අත්‍යවශ්‍ය වන ජල සම්පාදනය උදෙසා මූලික අඩිතාලම වූ වැව් තැනවීම ලංකාවේ රාජ්‍ය පාලකයින්ගේ වැදගත් ම රාජ්‍ය ප්‍රතිපත්තියක් විය.
   (1) වී වගාවෙන් රට ස්වයංපෝෂණය කිරීම සඳහා රටට ඇවැසි ජලය සැපයීමට නම් වැව් තැනවීම අත්‍යවශ්‍ය බව එකල ලංකාවේ රාජ්‍ය පාලකයින් තේරුම් ගෙන ඇත.
   (2) වී වගාව දියුණු කිරීම මගින් රට සහල්වලින් ස්වයංපෝෂණය කළ හැකි බවත් ඒ සඳහා ජලය ලබා දීමට වැව් තැනවීම අත්‍යවශ්‍ය බවත් රාජ්‍ය පාලකයෝ දැන සිටියහ.
   (3) රට සහලින් ස්වයංපෝෂිත තත්ත්වයට ගෙන ඒම සඳහා වී වගාව දියුණු කළ යුතු නම් ඊට අවශ්‍ය ජලය සැපයීම සඳහා වැව් තැනවිය යුතු බව ලංකාවේ රාජ්‍ය පාලකයෝ තේරුම් ගත්හ.
   (4) වී වගාව දියුණු කිරීමෙන් රට ස්වයංපෝෂණය කිරීමට නම් වගාවට ඇවැසි ජලය සැපයීම සඳහා වැව් තැනවීම අත්‍යවශ්‍ය කාර්යයක් බව ලංකාවේ රාජ්‍ය පාලකයෝ වටහා ගත්හ.

36. ප්‍රස්තුත මාතෘකාව පිළිබඳ ව මධ්‍යස්ථ ලෙස සංක්ෂිප්තව හා වාස්තවික ආකාරයෙන් කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ස්වභාවයයි.
   (1) ප්‍රශ්නයට තුඩුදුන් මාතෘකාව පිළිබඳ ව මැදහත්ව කෙටියෙන් හා අපක්ෂපාතීව කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ලක්ෂණයයි.
   (2) ඉදිරිපත් කරන මාතෘකාව පිළිබඳ ව අපක්ෂපාතීව, කෙටියෙන් හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කිරීම කතුවැකියක ලක්ෂණයි.
   (3) කතුවැකිය ලිවීමේදී තෝරාගත් මාතෘකාව පිළිබඳ මැදහත්ව සංක්ෂිප්තව හා යථාර්ථවාදීව කරුණු ඉදිරිපත් කෙරෙයි.
   (4) කතුවැකියේ දී තෝරා ගත් මාතෘකාවට අදාළ කරුණු අපක්ෂපාතීව, කෙටියෙන් හා තර්කානුකූලව ඉදිරිපත් කෙරෙයි.

37. 'විභාගය සමත් වුණායින් පස්සේ රස්සාවක් සොයාගන්නවා කියල අරවින්ද කීවා' යන වාක්‍යය ලිඛිත වහරට හැරවූ විට වඩාත් **නිවැරදි වාක්‍යය** දැක්වෙන වරණය තෝරන්න.
   (1) විභාගය සමත් වීමෙන් අනතුරුව රැකියාවක් සොයා ගන්නෙමුයි අරවින්ද කීවේ ය.
   (2) විභාගය සමත් වූවායින් පසු රැකියාවක් සොය ගන්නා බව අරවින්ද කීවේ ය.
   (3) විභාගය සමත් වීමෙන් පසු රැකියාවක් සොයා ගන්නා බව අරවින්ද කීහ.
   (4) විභාගය සමත්වීමෙන් පසු රැකියාවක් සොයා ගන්නේ යයි අරවින්ද කියයි.

38. වැරදි ප්‍රකාශය සහිත වරණය තෝරන්න.
   (1) සාහිත්‍ය නිර්මාණයක් බිහිවන්නේ සාහිත්‍යකරුවා තුළ පවත්නා ප්‍රතිභා ශක්තිය නිසා ය.
   (2) සාහිත්‍යයේ දී රසවින්දනය හා නිර්මාණය යන අංග දෙක ම එක හා සමාන වැදගත්කමක් දරයි.
   (3) රසවින්දනයට අදාළ සහජ ශක්තිය වාසනාගුණය නම් වේ.
   (4) සාහිත්‍යකරුවා සිය නිර්මාණ කාර්යය කෙරෙහි නිරන්තරයෙන් ලබන අභ්‍යාසය ව්‍යුත්පත්තියයි.

39. 'සාහිත්‍යාර්ණවයේ පරතෙර දුටු කෙනකු වශයෙන් වැලිවිට සෝරත හිමියෝ පැසසුම් ලබති' යන වාක්‍යයේ සාහිත්‍යාර්ණවය යනු,
   (1) සාහිත්‍යය නම් වූ නිධානයයි.
   (2) සාහිත්‍යය නම් වූ ගංගාවයි.
   (3) සාහිත්‍යය නම් වූ සාගරයයි.
   (4) සාහිත්‍යය නම් වූ ස්වර්ණ මංජුසාවයි.

40. 'බලා සිටු රහන රඟ මඬල කල් බඳ' යන පද්‍ය පාදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   (1) සිත් ඇද ගන්නා වූ කාන්තාවන් වේදිකාවේ රඟන ආකාරය බලා සිටින්න.
   (2) රංග මණ්ඩලයෙහි කාන්තාවන් නටන ආකාරය හොඳින් දැක ගන්න.
   (3) කාලය නොඉක්මවා වේදිකාවේ කාන්තාවන් නටන ආකාරය බලා හිඳින්න.
   (4) සිටුවරුන් වේදිකාවේ රංගනයේ යෙදෙන ආකාරය කල් නොඉක්මවා බලන්න.

* *



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை

අ.පො.ස. (සා.පෙළ) විභාගය 2013
க.பொ.த.(சா.தர)ப் பரீட்சை 2013

විෂයය / பாடம் } සිංහල භාෂාව හා සාහිත්‍යය    විෂයය අංකය / பாட இலக்கம் } 21

# ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය
## புள்ளி வழங்கும் திட்டம் - பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 2 | 31. | 2 |
| 02. | 2 | 12. | 4 | 22. | 4 | 32. | 4 |
| 03. | 3 | 13. | 1 | 23. | 1 | 33. | 1 |
| 04. | 1 | 14. | 3 | 24. | 4 | 34. | 1 |
| 05. | 2 | 15. | 1 | 25. | 1 | 35. | 2 |
| 06. | 1 | 16. | 2 | 26. | 2 | 36. | 3 |
| 07. | 4 | 17. | 1 | 27. | 3 | 37. | 2 |
| 08. | 2 | 18. | 3 | 28. | 4 | 38. | 4 |
| 09. | 2 | 19. | 2 | 29. | 1 | 39. | 3 |
| 10. | 4 | 20. | 3 | 30. | 2 | 40. | 1 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு 01 බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்த புள்ளிகள் 01 X 40 = 40

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 40



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## II පත්‍රය

---

★ **ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

**ප්‍රශ්න අංක 01**

**අපේක්ෂණය**      **භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනු ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන සඤ්ඤක අක්ෂර **දෙකක්** ද මූර්ධජාක්ෂර **දෙකක්** ද ලියා දක්වන්න.

(ii) පහත සඳහන් පද **දෙකෙහි** විරුද්ධාර්ථ රූප ලියන්න.
(අ) බහුශ්‍රැත      (ආ) නිරාකූල

(iii) පහත සඳහන් පද්‍ය ඛණ්ඩ දෙකෙහි තදකළු අකුරෙන් **දක්වෙන** පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) විමානයෙන් **බසිනු මැනවි** ස්වර්ණමාලියේ
(ආ) බෝ මළුවක ඇවිලෙන පහන් වැනිත් සේ තුන් සිත නිවී **සැදේවා.**

(iv) පහත සඳහන් පද **දෙක** විසන්ධි කොට ලියන්න.
(අ) පූජෝත්සවය      (ආ) තළඟන

(v) පහත සඳහන් (අ) සහ (ආ) කොටස්වල එන වාක්‍ය දෙකෙහි පවතින සදෝස් වචන **දෙක** නිදෝස් කොට ලියන්න.
(අ) දරුවන්ගේ පෝශණ අවශ්‍යතා පිළිබඳ ව දෙමාපියන් සැලකිලිමත් විය යුතු බව වෛද්‍යවරු පවසති.
(ආ) ගුරුමුෂ්ටි තබා නොගෙන ඉගැන්වීමෙහි යෙදෙන ගුරුවරයා සමාජයෙහි ගෞරවාදරයට පාත්‍ර වේ.

(vi) පහත සඳහන් වාක්‍ය **දෙක** නිදොස් කොට ලියන්න.
(අ) අක්කා හෝ අය්යා හෝ ශ්‍රමදානයට සහභාගී වෙති.
(ආ) විචාරකයන් බැද්දේගම චිත්‍රපටය ඇගයීමට පාත්‍ර කළහ.

(vii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් නිපාත පද **දෙක** තෝරා ලියන්න.
උදේ පටන් පැවැති අධික වර්ෂාපතනය නිසා ක්‍රීඩා තරගයට බාධා ඇති විය.

(viii) මෙහි (අ) සහ (ආ) කොටස්වල එන කර්මකාරක වාක්‍ය **දෙක** කර්තෘකාරකයට හරවා ලියන්න.
(අ) ප්‍රතිමා ශිල්පීන් විසින් ප්‍රදර්ශන තරගය සඳහා ප්‍රතිමා කිහිපයක් ඉදිරිපත් කෙරෙයි.
(ආ) මාර්ටින් වික්‍රමසිංහ විසින් ගම් පෙරළිය, යුගාන්තය හා කලියුගය යන තුන් ඈඳුතු නවකතා රචනා කෙරිණි.

(ix) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙක** තෝරා ලියන්න.
චිත්තාකර්ෂණීය නැටුම් සංදර්ශනයක් ඉදිරිපත් කළ ඇය සුප්‍රසාට තිළියකි.

(x) දළදා මාලිගාවේ පුදසිරිත් ආශ්‍රිත ජන වහරට අයත් පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) හේමකඩ      (ආ) අවුල්පත      (ලකුණු 20 යි.)

(i). ඟ, ඦ, ඬ, ඳ, ඹ
ට, ඨ, ඩ, ඪ, ණ, ළ, ෂ, ර, ඬ

*(එක අකුරකට ලකුණු $^1/_2$ බැගින්)*

(ii). (අ) අල්පශ්‍රැත
(ආ) ආකූල

WWW.OLEVELAPI.COM

(iii). (අ) විධි ක්‍රියා/ විධාන ක්‍රියා/ විදි කිරිය
(ආ) ආශීර්වාද ක්‍රියා/ ආසි කිරිය/ ප්‍රාර්ථනා ක්‍රියා

(iv). (අ) පූජා + උත්සවය
(ආ) තළ + අඟන

(v). (අ) පෝෂණ
(ආ) ගුරු මුෂ්ටි

*(වාක්‍යය ම ලියා තිබුණත් ලකුණු දෙන්න)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(vi). (අ) අක්කා හෝ අයියා හෝ ශ්‍රමදානයට සහභාගි වෙයි.

(ආ) විචාරකයෝ බැද්දේගම චිත්‍රපටය ඇගයීමට පාත්‍ර කළහ.

*(වචන දෙක පමණක් නිදොස් කොට වෙනම ලියා තිබුණත් ලකුණු දෙන්න)*

(vii). පටන්, නිසා

(viii). (අ) ප්‍රතිමා ශිල්පීහු/ ශිල්පයෝ ප්‍රදර්ශන තරගය සඳහා ප්‍රතිමා කිහිපයක් ඉදිරිපත් කරති.

(ආ) මාර්ටින් වික්‍රමසිංහ ගම් පෙරළිය, යුගාන්තය හා කලියුගය යන තුන් ඈඳුතු නවකතා රචනා කළේය/ කෙළේ (ය)

මාර්ටින් වික්‍රමසිංහයෝ/ මාර්ටින් වික්‍රමසිංහ සූරීහු ගම් පෙරළිය, යුගාන්තය හා කලියුගය යන තුන් ඈඳුතු නවකතා රචනා කළහ/ කළෝය/ කළාහුය.

(ix). නැටුම්, කළ

(x). (අ) රන් කද/ බුද්ධ පූජා, දේව පූජා ආදියට දානය/ ආහාර ගෙන යන කද

(ආ) කැවිලි වර්ග/ අතුරුපස

## ප්‍රශ්න අංක 02

**අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් **එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) නිවෙස්, කර්මාන්තශාලා, ව්‍යාපාරික ස්ථාන ආදියෙහි රැස්වන කුණුකසල අවට පරිසරයට බැහැර කිරීමේ අශෝභන ක්‍රියාවට ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙක් නැඹුරු ව සිටිති. මෙලෙස තැන තැන ගොඩගැසෙන කුණු ගොඩවල් පරිසරයට මෙන් ම මිනිසුන්ගේ සෞඛ්‍යයට ද බලවත් තර්ජනයකි. මේ තත්ත්වයට හේතු වී ඇත්තේ කුණු කසල බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නැතිකමටත් වඩා ඒ සම්බන්ධයෙන් ජනතාව දක්වන නොසැලකිල්ල බව පෙනේ. එබැවින් කුණුකසල බැහැර කිරීමේ විධිමත්, සෞඛ්‍යාරක්ෂක, පරිසර හිතකාමී, ක්‍රමෝපාය හඳුන්වාදීමට සමගාමී ව ජනතා ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම ද වැදගත් ය.

(ආ) පාසල් ගොඩනැගිලි, ලීබඩු, විද්‍යා උපකරණ, පුස්තකාල පහසුකම්, නිල ඇඳුම්, පෙළපොත් හා ශිෂ්‍යාධාර පහසුකම් ආදි විවිධාංග ඔස්සේ මෙරට නිදහස් අධ්‍යාපනය උදෙසා රජය විශාල මුදලක් වැය කරයි. මින් ප්‍රයෝජන ලබා ගෙන විවිධ ක්ෂේත්‍රවලින් බිහිවන උගතුන් වැඩි වැටුප් හා වරප්‍රසාද අපේක්ෂාවෙන් විදේශගත වීමේ ප්‍රවණතාවක් මෙකල දැකිය හැකි ය. මොවුන් අතුරෙන් බහුතරයක් ඒ රටවල ම ස්ථිර ව පදිංචි වන බව ද වාර්තා වේ. නිදහස් අධ්‍යාපනයේ ඵල ලබන සියලු දෙනාගේ යුතුකම වන්නේ තම මව්බිමෙහි අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ය.

(ඉ) නිවාස, කර්මාන්තශාලා, මංමාවත් හා වෙනත් පොදු ස්ථාන ආලෝකකරණය සඳහාත්, විවිධ මට්ටමේ යාන්ත්‍රික කටයුතු සඳහාත්, භාවිත කෙරෙන ප්‍රධානතම බලශක්ති මූලය වන විදුලිය පරිභෝජනය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. අවධිමත් පරිභෝජන රටා හා වංචනික ක්‍රියා නිසා අපතේ යන විදුලි ඒකක ප්‍රමාණය ද සුළුපටු නො වේ. අධික විදුලි බිලක් ගෙවීමෙන් හා නිතර නිතර විදුලි කප්පාදුවට මුහුණ දීමෙන් මෙහි ප්‍රතිවිපාක විඳින්නෝ පොදු මහජනතාව ය. මේ අනුව වංචනිකයනට දැඩි දඬුවම් පැමිණවීමත්, අරපිරිමැස්මෙන් විදුලිය පරිභෝජනයට මහජනතාව පෙලඹවීමත් කඩිනමින් කළ යුතුව තිබේ.

(ඊ) ගුවන්විදුලිය මෙරට ප්‍රධානතම විද්‍යුත් මාධ්‍යය වශයෙන් පැවැති සමය ළමා ගී සාහිත්‍යයේ ස්වර්ණමය යුගය බව කියැ වේ. ඒ, එකල ළමා මනසට උචිත හා චරිත සංවර්ධනයට ඉවහල් වූ අරුත්බර ළමා ගී නිර්මාණ සම්භාරයක් දායාද වීම නිසා ය. වර්තමානයේ ගුවන්විදුලි නාලිකා විශාල ප්‍රමාණයක් හා ප්‍රබලතම විද්‍යුත් මාධ්‍යය ලෙස රූපවාහිනිය ක්‍රියාත්මක වුවත් ළමා ගී නිර්මාණය වීමට ඒවායේ දායකත්වයක් නොමැති තරම් ය. මෙකල ඇතැම් මාධ්‍ය මගින් විකාශනය කෙරෙන ළමා වැඩසටහන්වලදී ළමයින් ගායනා කරන්නේ ළමා මනසට අනුචිත හරසුන් ගීත ය. මේ නිසා ළමා චරිත සංවර්ධනයට බෙහෙවින් ම ඉවහල් වන ළමා ගීත බිහි කිරීමේ කාර්යභාරයට දායක වීම සියලු ම විද්‍යුත් මාධ්‍යවල වගකීමකි. (ලකුණු 25 යි)

*එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(අ) කුණු කසල විධිමත් ව/ නිසි ලෙස බැහැර කරමු.

කුණු කසල විධිමත් ව/ නිසි ලෙස බැහැර කිරීමේ අවශ්‍යතාව/ වැදගත්කම.

(ආ) ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය

ශ්‍රී ලංකාවේ උගතුන් රට හැර යාම

නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල මව්බිමට ලබාදෙමු.

(ඉ) විදුලිය සුරකිමු/ සුරැකීමේ වැදගත්කම.

විදුලිය නාස්ති නොකරමු.

විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කරමු.

(ඊ) ළමාගීත කලාවක වැදගත්කම/ අවශ්‍යතාව

ළමාගීත හා චරිත සංවර්ධනය

විද්‍යුත් මාධ්‍යවල වගකීම හා ළමා ගීත

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | - | ලකුණු 08 යි |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි |

01. සාරවත්භාවය - ලකුණු 07 යි

විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

WWW.OLEVELAPI.COM

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය සා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතුය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

★ *සැලකිය යුතුයි* රචනාව සඳහා මාතෘකාව ගැළපේ නම් ලකුණක් දෙන්න

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200 ට වඩා අඩු වන කල්හි ඉහත දක් වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02 වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (✗) ලකුණ යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

1, 2, 3, යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂ්‍යය — වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

**ප්‍රශ්න අංක 03**

**අපේක්ෂණය** – කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත ආර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

3. පහත දක්වෙන ඡේදය වචන 50 - 60 අතර ගණනකින් යුක්ත වන සේ **සාරාංශ කොට ලියන්න**. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

අපේ පුරෝගාමී ඉතිහාසඥයකු හා පුරා විද්‍යාඥයකු වන මහාචාර්ය පරණවිතාන මහතා කියන්නේ ඉතිහාසය පවා හැඩගැස්වීමට වෘක්ෂලතාදිය හේතුකාරක වන බවයි. මනුෂ්‍යවාසයක් පවා ඇතිව තිබෙන්නේ අනිවාර්යයෙන් ම වෘක්ෂලතාදිය නොඅඩු ව වැවෙන ප්‍රදේශ පාදක කොටගෙන බව එතුමා අපට ඒත්තු ගන්වයි. රටක වෘක්ෂලතාදිය ඇතිවෙන්නේ එහි දේශගුණය, පස ආදි භූගෝලීය සාධකයන් මුල්කරගෙන ය. තව ද ඒ වෘක්ෂලතාදිය අනුව ඒ රටේ ඉතිහාසයත් එක්තරා ප්‍රමාණයකට හැඩ ගැසෙන බව ද කිව යුතුයි. මනුෂ්‍යවාසයක් ඇති වී තිබෙන්නේ මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන වෘක්ෂලතාදිය පහසුවෙන් වගා කළ හැකි ප්‍රදේශවල ය. පරිසරය ද, වෘක්ෂලතාදිය ද නිසියාකාරව ආරක්ෂාවීම ජන ජීවිතයෙහි පැවැත්මට මහත් ම ආධාරයක් වන බව ඉන් ගම්‍යමාන වේ. එහෙත් වෘක්ෂය පිළිබඳ පුරාණයේ තිබූ සැලකිල්ල අද දින බොහෝ සේ මිය ගොස් ය. වෘක්ෂ විනාශය අද දින ජාතික ප්‍රශ්නයක් බවට පත් ව ඇත.

අවිචාරවත් ලෙස වෘක්ෂ විනාශ කිරීම හේතු කොට ගෙන ලක්දිව ඇතැම් පෙදෙස් කාන්තාර වීමේ ලකුණු පළ කරන බව සඳහන් වේ. කෙළවරක් නොමැති ව කෙරෙන්නාවූ වෘක්ෂ විනාශය තුළින් ජනිත කරන්නාවූ අයහපත් ප්‍රතිඵල අනාගතයේදී අපට භුක්ති විඳීමට සිදුවනු ඇතැයි දේශීය මෙන් ම විදේශීය බුද්ධිමත්තු ද පෙන්වා දී ඇත්තාහ. මෙහිදී සිහිපත් කළ යුතු විදේශීය පඬිවරයකු නම් ආර්.එල්.බ්‍රෝහියර් මහතාය. ලංකාවේ අනතුරට පත් වනාන්තර පිළිබඳ ව ඔහු කතා කොට ඇත්තේ වේදනාබර හදවතකිනි. ආධ්‍යාත්මික වශයෙන් ඉතා ප්‍රබෝධජනක වූ ද, ඇසට ඉතා සංතෘප්තිකර දර්ශනයක් වූ ද, වනාන්තර ඉතා ආසන්න අනාගතයේදී ම පුරාවෘත්තයක් බවට පත් වේයැයි යනුවෙන් බ්‍රෝහියර් මහතා අනතුරු අඟවයි. (ලකුණු 10 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි**

1. අන්තර්ගතය (ප්‍රධාන අදහස් සඳහා) - ලකුණු 06 යි
2. වචන ගණන (වචන 50 - 60 අතර තිබීම සෑහේ) - ලකුණු 02 යි
3. ශිල්පීය දක්ෂතා (වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ ආදිය) - ලකුණු 02 යි

**අපේක්ෂිත ප්‍රධාන අදහස්**

★ ජීවිතයේ (මනුෂ්‍යයාගේ) පැවැත්මට වෘක්ෂලතාදිය අවශ්‍ය වන බව

★ වෘක්ෂලතාදිය කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීමත් ඒවා විනාශ කිරීමත් කාන්තාර ඇති වීමට හේතු වන බව

★ වෘක්ෂලතාදිය ඇසට ප්‍රියජනක දර්ශනයක් බව

★ ඒ නිසා වෘක්ෂලතාදිය රැකගත යුතු බව

★ වෘක්ෂලතාදිය නිසා රටක ඉතිහාසය හැඩ ගැසෙන බව

★ වන විනාශයේ අයහපත් ප්‍රතිඵල අනාගතයේ දී භුක්ති විඳීමට සිදුවනබව බොහෝ උගතුන් පෙන්වා දී ඇති බව

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන 45 ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65 ට වැඩි කල්හි හෝ 45 ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 හෝ 02 හෝ පිරිනමන්න.

**ප්‍රශ්න අංක 04**

**අපේක්ෂණය** ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම

4. පහත දැක්වෙන **ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට** උත්තර සපයන්න.

දහතුන් වැනි සියවසේ දී සිදු වූයේ රජරටේ බලය අහිමි වූ පාලකයින් මායා රටට යාම නො වේ. රාජධානිය මාඝ විසින් අල්ලාගනු ලැබූ පසු මායා රටේ සහ රෝහණයේ ප්‍රාදේශික අධිපතීන් පිරිසක් ඒ විදේශිකයන්ට පක්ෂපාත නො වී සිටියහ. ඔවුහු ස්වාධීන පාලකයන් හැටියට ක්‍රියා කරන්නට පටන් ගත්හ. තොරපා දමනු ලැබූ කුලීනයනුත් ඔවුන්ගේ දාසයනුත් රජරටේ දී විඳින්නට සිදු වුණු පීඩාවලින් බේරී ජීවත් වන්නට පැමිණි සෙස්සනුත් නිසා මේ පෙදෙස්වල ජනගහනය වැඩි වී ගියේ ය. ඒ වන විට තෙත් කලාපයේ තිබුණු කුඹුරු ප්‍රමාණය සීමා සහිත වූ හෙයින්, මේ වැඩි වූ ජනසංඛ්‍යාවට එයින් ආහාර සැපයීම උගහට විය. එහෙයින් මෙතෙක් වගා නොකර තිබුණු ලොකු කැලෑ යායවල් එළි කර කුඹුරු බවට හෝ වතු බවට හරවන ලදි. මේ වනාහි I පරාක්‍රමබාහු රජු මායා රටේ පමණක් රජකම කරද්දී පස්දුන් කෝරළේ වගුරු බිම් අස්වැද්දීමෙන් පටන් ගත් වැඩ පිළිවෙළ වඩා පුළුල් ලෙස දිගට ම කර ගෙන යෑමකි. අලුත් ප්‍රදේශයේ ස්වභාවයට හැඩ ගැසෙන්නටත් කෑම් බීම් අතින් අලුත් පුරුදු ඇති කර ගන්නටත් වියළි කලාපයේ සිට තෙත් කලාපයට සංක්‍රමණය කළ අයට සිදු වූයේ ය. රජරට සිටිය දී පුරුදු ව සිටි ගිතෙල් සහ තලතෙල් මෙහි සුලබ නො වීය. එහෙයින් පොල්තෙල්වල රස බලන්නට ඔවුන්ට සිදු විය. ලොකු බිම් යායවල පොල් වගා කරන ලදි. II පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී කළුතර සහ බෙන්තොට අතර වෙරළබඩ තීරය එළි කර පොල් වගා කරන ලද බව කියා තිබේ. එකල පොල් වෙළෙඳ බඩුවක් හැටියට පිටරට යවන ලද්දේ දැයි දැන ගන්නට නැත. එහෙත් කුරුඳු ගසත් එහි සුවඳ පොතුත් ගැන සිංහල පොත්පත්වල පළමුවරට සඳහන් වන්නේ දඹදෙණි යුගයේ දීය.

(i) මේ ඡේදයේ සඳහන් පරිදි විදේශීය ආක්‍රමණයෙන් පසුව ස්වාධීන පාලකයන් වශයෙන් කටයුතු කළෝ කවරහු ද?
(ii) වැඩි වූ ජනගහනයට ආහාර සැපයීම සඳහා යෙදූ උපක්‍රමය කුමක් ද?
(iii) මේ ඡේදයේ සඳහන් වන රජරට රාජධානිය අල්ලා ගත් ආක්‍රමණිකයාගේ නාම කුමක් ද?
(iv) වියළි කලාපයේ සිට සංක්‍රමණය වූ පිරිසට අලුතින් ආහාරයට ගැනීමට සිදු වූ තෙල් වර්ගය කුමක් ද?
(v) කතුවරයා සඳහන් කරන අන්දමට පළමුවරට කුරුඳු පිළිබඳ සාක්ෂිය හමුවන්නේ කවර යුගයේ ද?

(ලකුණු 10 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**අපේක්ෂිත උත්තර**

(i) මායා රටේ සහ රෝහණයේ ප්‍රාදේශික අධිපතීන් පිරිසක්

(ii) මෙතෙක් වගා නොකර තිබුණු ලොකු කැලෑ යායවල් එළි කර කුඹුරු බවට හෝ වතු බවට හැරවීම/ හරවා වගා කිරීම

(iii) මාඝ

(iv) පොල්තෙල්

(v) දඹදෙණිය යුගයේ දී / දඹදෙණි

**ප්‍රශ්න අංක 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂයා සතු කුසලතා

5. උතුරු සත්සිරිපුර ප්‍රදේශයට විදුලි බලය ලබා දීම සඳහා අදාළ විදුලි රැහැන් ඇදීම ආදි මූලික කටයුතු නිම කොට මාස දහයක් පමණ ගත වී ඇතත් තවමත් විදුලිබල සැපයුම ලබා දී නොමැත. පවුල් 200කට අධික පිරිසක් ප්‍රදේශයේ ජීවත් වන අතර, ඉන් බහුතරයක් මේ වන විටත් විවිධ ස්වයං රැකියා කටයුතුවල නිරත වෙමින් සිටිති. ඔවුන්ට මෙන් ම පාසල් සිසුනට ද විදුලිය ලැබීමෙන් ස්වකීය කාර්යයන් පහසු වනු ඇත. මේ කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වන සපුමල් බණ්ඩාර ඔබ යයි සිතා සත්සිරිපුර විදුලිබල මණ්ඩලයේ අධිකාරී වෙත, කඩිනමින් විදුලිබල සැපයුම ලබා දෙන ලෙස කෙරෙන ඉල්ලීම සහිත රාජකාරි ලිපියක් සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

**නැතහොත්**

ශාකවල විවිධ කොටස් වැනි දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් දර්ශනීය දුඹපැතුම්පත් හා බිත්ති සැරසිලි ආදි විසිතුරු නිර්මාණ සකස් කිරීමට පුහුණු කිරීමේ වැඩමුළුවක් පසුගිය දා සමගිපුර සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පැවැත්විණි. වැඩමුළුව අවසානයේ නිර්මාණ ප්‍රදර්ශනයක් ද සංවිධානය කෙරිණි. ප්‍රදර්ශනය නැරඹීමට ප්‍රදේශවාසීහු සහභාගී වූහ. දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරිතුමා ප්‍රධාන අමුත්තා විය. එතුමා ප්‍රදර්ශනය විවෘත කරමින් කළ කතාව හැමදෙනාගේම ප්‍රසංශාවට භාජනය විය. සමගිපුර මාණ්ඩලික වාර්තාකරු ඔබ යයි සිතා ඉහත කරුණු ආශ්‍රයෙන් පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

*(ලකුණු 15 යි)*

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 15 යි**

**රාජකාරි ලිපිය**

01. ආකෘතිය සඳහා - ලකුණු 04 යි
02. අන්තර්ගතය සඳහා - ලකුණු 08 යි
03. ශිල්පීය දක්ෂතා සඳහා - ලකුණු 03 යි

WWW.OLEVELAPI.COM

01. ආකෘතිය සඳහා - ලකුණු 04 යි

- යවන්නාගේ නම, තනතුර, ලිපිනය සහ දිනය - ලකුණු 01 යි
- ලබන්නාගේ ලිපිනය - ලකුණු 01 යි
- ආමන්ත්‍රණය (මාතෘකාවට පෙර යොදා තිබිය යුතුයි) - ලකුණු 01 යි
- මාතෘකාව සහ අත්සන - ලකුණු 01 යි

*(යවන්නාගේ තනතුර, යවන්නාගේ ලිපිනය තුළ හෝ ලිපිය අවසානයේ හෝ සඳහන් වී තිබිය යුතුයි. රාජකාරි ලිපි සඳහා නිර්දේශිත ආකෘති 2 ම නිවැරදි සේ පිළිගන්න.)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

02. අන්තර්ගතය සඳහා - ලකුණු 08 යි

- ❖ සත්සිරිපුර ප්‍රදේශයට විදුලිය රැහැන් ඇදීමේ මූලික කටයුතු නිමවී මාස දහයක් ගතවී ඇතත් තවම විදුලිය නොමැති බව - ලකුණු 02 යි
- ❖ පවුල් සංඛ්‍යාව 200 කට අධික පිරිසක් ප්‍රදේශයේ ජීවත්වීම හා බහුතරයක් ස්වයං රැකියාවල නියැලීම - ලකුණු 02 යි
- ❖ විදුලිය ලැබීමෙන් පාසල් සිසුන්ගේ කාර්යයන් පහසු වීම - ලකුණු 02 යි
- ❖ සත්සිරිපුර ප්‍රදේශයට විදුලිය ලබාදෙන ලෙස ඉල්ලීම - ලකුණු 02 යි

03. ශිල්පීය දක්ෂතා සඳහා - ලකුණු 03 යි

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

★ නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

**පුවත්පත් වාර්තාව - ලකුණු 15 යි**

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබා ගන්න.

| | | |
|---|---|---|
| 01. ආකෘතිය සඳහා | - | ලකුණු 04 යි |
| 02. අන්තර්ගතය සඳහා | - | ලකුණු 08 යි |
| 03. ශිල්පීය දක්ෂතා සඳහා | - | ලකුණු 03 යි |

01. ආකෘතිය සඳහා - ලකුණු 04 යි

| | | |
|---|---|---|
| - මාතෘකාව | - | ලකුණු 02 යි |
| - වාර්තාකරු | - | ලකුණු 01 යි |
| - නිර්මාණශීලිබව | - | ලකුණු 01 යි |

02. අන්තර්ගතය සඳහා - ලකුණු 08 යි

| | | |
|---|---|---|
| - දේශීය අමුද්‍රව්‍ය භාවිතය | - | ලකුණු 01 යි |
| - දර්ශනීය සුභ පැතුම් පත් | - | ලකුණු 01 යි |
| - බිත්ති සැරසිලි | - | ලකුණු 01 යි |
| - පුහුණු කිරීමේ වැඩ මුළුව | - | ලකුණු 01 යි |
| - ස්ථානය (සමගිපුර සංස්කෘතික මධ්‍යස්ථානය) | - | ලකුණු 01 යි |
| - නිර්මාණ ප්‍රදර්ශනය | - | ලකුණු 01 යි |
| - ප්‍රදේශවාසීන් සහභාගී වීම | - | ලකුණු 01 යි |
| - ප්‍රධාන අමුත්තා (දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී තුමා) | - | ලකුණු 01 යි |

03. ශිල්පීය දක්ෂතා සඳහා - ලකුණු 03 යි

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

★ නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

**ලකුණු 15 යි**

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබා ගන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....
WWW.OLEVELAPI.COM

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## III පත්‍රය

---

★ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**

★ **1, 2, 3, 4 ප්‍රශ්න වලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංක 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි**
මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා
ගමේ ඉඳන් ආවේ මම දෙකෙන් තුනට සමත් වෙලා."
(අ) ඉහත සඳහන් ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
(ආ) මොනිකා රුවන්පතිරණ කිවිඳිය විසින් රචනා කරන ලද කාව්‍ය සංග්‍රහයක් නම් කරන්න.

(ii) "රුපියලක් දෙකක් විතර. වැස්සොත් එහෙම කීයක් වත් නෑ."
(අ) මෙය පවසන්නේ කාට ද?
(ආ) මෙම පිළිතුර ලබා දෙන්නේ කුමක් විමසූ විට ද?

(iii) "මගේ පපුව ගිඩි ගිඩි ගාලා ගැහෙනවා"
(අ) මෙසේ පවසන්නේ කවරෙක් ද?
(ආ) කෙබඳු අවස්ථාවක දී ද?

(iv) "මම දෙදෙනා ම දිටිමි. එහෙයින් සත් දවසක් නොවෙයි."
(අ) මෙහි දෙදෙනා ම යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ගැන ද?
(ආ) ඒ දෙදෙනා ම දුටු තැනැත්තා කවරෙක් ද?

(v) (අ) එච්.එම්. කුඩලිගම සිය කාව්‍ය නිර්මාණ මුලින් ම යොමු කළේ කිනම් පුවත්පතකට ද?
(ආ) වැහි වළාකුළු දකින විට සතුටට පත්වන කුරුල්ලකු ගැන 'වැස්ස' කවිපෙළේ දැක් වේ. එම කුරුල්ලා නම් කරන්න.

(vi) (අ) හත්ත හත්තික සිටාණන්ගේ වස්තුවෙහි දැක්වෙන ගන්ධක සිටාණන්ගේ භාර්යාවගේ නම කුමක් ද?
(ආ) බත් බැළයා තුන් අවුරුද්දක් මෙහෙ කොට ලද බත් තළිය පූජා කළේ කාට ද?

(vii) (අ) කාව්‍යශේඛරයේ කියැවෙන ආකාරයට එය රචනා කර ඇත්තේ කාගේ ආරාධනයෙන් ද?
(ආ) කාව්‍යශේඛරයේ දැක්වෙන බමුණා සිය මිතුරා වෙත තබා ගිය මුදල කොපමණ ද?

(viii) "අතක් බෝසතුගෙ **ළෙයි** තබමින් විමසා
මදක් සැලි සැලී පණ හල තිබෙන නිසා"
(අ) මෙම පද්‍යයේ ඉතිරි පේළි දෙක ලියා දක්වන්න.
(ආ) තද කළු අකුරෙන් දැක්වෙන වචනයේ අර්ථය ලියන්න.

(ix) (අ) රහතන් වහන්සේ නමකට පිළිණි කවු අලයක් දන් දීමේ පිනින් ඊළඟ ආත්ම භාවයේ දී නිධානයක් ලද අයකු ගැන කියැවෙන කථා වස්තුව නම් කරන්න.
(ආ) එම කතාව උපුටා ගෙන ඇත්තේ කිනම් ග්‍රන්ථයකින් ද?

(x) (අ) 'රන් තැටියක කඳුළු' සහ 'තොවදිම් සිදුහත්' යන කාව්‍ය සංග්‍රහ රචනා කළ කවියා නම් කරන්න.
(ආ) 'අපටත් දවසක ඉර පායාදෝ' කෙටි කතාව කාගේ නිර්මාණයක් ද?

*(ලකුණු 02 × 10 - 20 යි)*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(i) (අ) පියසේන

(ආ) අංගුලිමාලගේ සිහින, ඔබ යෙහෙළිය ඇය ගැහැනිය, විසි වසක ශේෂ පත්‍රය, අසන් පත්තිනි දේවතාවි, තහනම් **දේශයකින්**, හිපොක්‍රටීස් සහ රොගිනිය, අපි දෙන්නා සහ තවත් කිහිප **දෙනෙක්**, ඇගේ **ලෝකය**, **අලුත්ම** සිහිනය

(ii) (අ) බාබු සහිබ්ට, බාබුජීට

(ආ) "ඔහේ දවසට කීයක් විතර හම්බ කරනවද" යනුවෙන් බාබු සහිබ් රාසුල්ජූගෙන් ඇසූ විට

(iii) (අ) ~~සිරියාවතී~~

(ආ) ~~චිත්‍රයට ලකුණු හැත්තෑපහට වැඩි ළමයි අත් උස්සන්ට යැයි පද්මා මිස් පන්තියේ දී පැවසූ අවස්ථාවේ.~~

(iv) (අ) පණුවන් දෙදෙනා / මත්ලුංගභෝජක පණුවන්

(ආ) ජීවක/ ජීවක වෛද්‍යවරයා

(v) (අ) සිංහල බලය

(ආ) මොනරා/ මයුරා

(vi) (අ) චින්තාමණී

(ආ) පසේ බුදුකෙනෙකුන් වහන්සේට

(vii) (අ) උලකුඩය දේවියගේ, 6 වන පරාක්‍රමබාහු රජුගේ දියණියගේ, ලෝකනාථා දේවියගේ

(ආ) (කහවණු/ මසුරන්) දහසක්

(viii) (අ) පසක් තෙදැති දෙවියන් යදිමින් තොලසා
නැතක් කන්නලවු බස් තෙපලයි මෙලෙසා

WWW.OLEVELAPI.COM

(ආ) ළයෙහි, හදවතෙහි, පපුවෙහි

(ix) (අ) උත්තරෝලිය වස්තුව

(ආ) සද්ධර්මාලංකාරය

(x) (අ) ~~ඇශෝක~~ දයාසේන ගුණසිංහ

(ආ) ඒ.වී. සුරවීර

***(ලකුණු 2 x 10 = 20 යි)***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංක 02**

**අපේක්ෂණය** - 1. නිර්දේශිත පාඨ පිළිබඳ අවබෝධය

2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි (එක් කොටසකට ලකුණු 05 බැගින්)**

තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදිව තේරුම ලියා ඇත්නම් එක වචනයකට ලකුණු 01 බැගින් - ලකුණු 02 යි

සමස්ත අර්ථයට - ලකුණු 03 යි

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "නැගෙන සැණකෙළි හඬින් සිව්දෙස
පිරී **අබිසෙස්** ලැබී සොම්නස
විදුලි එළියෙන් පුරය **එකලු ව**
අසිරිමත් සුර ලොවක් බිහිවිය"

(ii) "මෙවන් **දරිද්‍රතාවකින්** මතු වූ මිනිසකුගේ **උදාරත්වයට** මගේ මිත්‍ර කවියා හිස නමා සිටිය යුතු ය."

(iii) "කීයෙන් ඔහු මෙසේ
**අදහළ** නකත් දවසේ
පාවා දෙන ලෙසේ
පටන් ගෙන පියබමුණු **නොලසේ**"

(iv) "මෙතෙක් දවසේ **බැළ මේ** කරන ගමනේ එක දවසක්වත් අඩුවක් නොපෑ මෙහෙ කළ **නියාව** යහපත් ම යයි කීවූ ය."

*(ලකුණු 05 × 04 = 20 යි)*

## අපේක්ෂිත උත්තර

(i) **අබිසෙස්** - අභිෂේක/ උච්ච අවස්ථාවට පත් වී/ උසස් ම අවස්ථාවට පැමිණ/ උපරිම අවස්ථාවට පත් වී / අභිෂේකයට / සතුට වර්ධනය / බොහෝ ගැඹුරු / තරමක් ගැඹුරු / රාජ්‍යත්වයට පත්වීම

**එකලුව** - ඒකාලෝක වී/ මහත් ආලෝකයට පත් වී/ එකම ආලෝකයක් බවට පත්වී

සතර දිගාවෙන් මතු වී එන්නා වූ සැණකෙළි නාදයෙන් පිරී මහත් සතුට උපරිම අවස්ථාට පත් විය. විදුලි ආලෝකයෙන් පුරය ඒකාලෝක වී ආශ්චර්යයෙන් පිරි දෙව් ලොවක් ඇති විය

WWW.OLEVELAPI.COM

(ii) **දරිද්‍රතාවකින්** - දිළිඳුකමකින්/ දුප්පත්කමකින්/ අගහිඟකමකින් / දුගී බව

**උදාරත්වයට** - උසස් බවට/ ශ්‍රේෂ්ඨ බවට / උතුම් බවට / උදාර බවට

මෙබඳු දිළිඳුකමකින් මතු වූ මිනිසෙකුගේ උසස් ස්වභාවයට මගේ යහළු කවියා ගරු කළ යුතුය/ හිස පහත් කොට සිටිය යුතු ය.

(iii) **අදහළ** - අදාළ/ යෝග්‍ය/ නියමිත / සුදුසු / නිශ්චිත කාලයේ වරින්/ නියමිත/ ගැළපෙන

**නොලසේ** - අලස නොවී/ ප්‍රමාද නොවී/ අප්‍රමාදව/ කල් නොයවා / අකම්මැලිව / උනන්දුවෙන් වහා

ඔහු මෙසේ කී නිසා අදාළ නැකැත් දවසේ සරණ පවා දීමට පිය බමුණා නොපමාව කටයුතු පටන් ගෙන



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iv) බැළමේ - බැළ මෙහෙවර/ වැඩකාරකම්/ දාසකම්/ මෙහෙකාරකම්/ සේවාකම්/ උදව්ව
නියාව - අයුරු/ ආකාරය/ විදිය/ හැටි/

මෙපමණ කාලයක් බැළමෙහෙවර කරද්දී එක දවසක්වත් අඩු පාඩුවක් නොපෙන්වා සේවය කළ ආකාරය හොඳ යැයි කිවූහ.

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

| | | |
|---|---|---|
| **අපේක්ෂණය** | - | ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම |
| **ලකුණු විග්‍රහය** | - | 3, 4 ප්‍රශ්න අනිවාර්යයි. - **ලකුණු 15 යි**<br>5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුයි. - **ලකුණු 10 යි** |

3, 4 ප්‍රශ්නවල තෝරාගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන්ව විස්තර සහිතව ලියා තිබිය යුතු ය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ 04 ට | - | ලකුණු 04 යි | ලකුණු 15 යි |
| සමස්ත විස්තරයට | - | ලකුණු 11 යි | |

★ **3, 4 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125 ක් පමණ තිබීම සෑහේ.**

**ප්‍රශ්න අංක 03**

3. "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කතාවේ සාර්ථකත්වය සඳහා මනා චරිත නිරූපණය ඉවහල් වී ඇති ආකාරය
   (i) සිරියාවතීගේ චරිතය හා
   (ii) සිරියාවතීගේ මවගේ චරිතය ඇසුරෙන් නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

(i) සිරියාවතීගේ චරිතය නිරූපණය වන අවස්ථා

❖ දුප්පත්කමෙන් පීඩා විඳීම හා අගහිගකම්වලට මුහුණ දීම
❖ ඉගෙනීම කෙරෙහි පැවති සහජ දක්ෂතාව හා උනන්දුව
❖ කටුක ජීවන අත්දැකීම් හා අධිෂ්ඨානශීලීභාවය
❖ ගුරු දෙගුරුන් කෙරෙහි භක්තිය හා සංවේදීභාවය
❖ ගැමි දැරියක ලෙස ලැජ්ජාව, භය ආදී ගුණාංග ඇගේ චරිතය තුළින් ඉස්මතු වීම

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ii) සිරියාවතීගේ මවගේ චරිතය නිරූපණය වන අවස්ථා

- ❖ ධෛර්ය සම්පන්නව ජීවිතයට මුහුණ දීම
- ❖ ගැමි මවකගේ වගකීම නිසියාකාරව ඉටු කිරීම
- ❖ දිළිඳුකමෙන් පීඩා විඳීම හා අරපිරිමැස්මෙන් ක්‍රියා කිරීම
- ❖ ජීවිතය ඇසුරෙන් ලද පරිණතභාවය
- ❖ ගැමි ගැහැනියක කෙරෙහි දැකිය හැකි දරු සෙනෙහස, උපේක්ෂාසහගත බව, ආවේගශීලීභාවය, දුක්බර බව ආදි සංකීර්ණ ලක්ෂණ ඇගේ චරිතය තුළින් ඉස්මතු වීම

*(ගැළපෙන වෙනත් උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ 2 ක් බැගින් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)*

***උදාහරණ සඳහා ලකුණු 04 යි***
***සමස්ත විස්තරයට ලකුණු 11 යි***
***මුළු ලකුණු 15 යි***

**නැතහොත්**

(i) උපමා භාවිතය හා

(ii) අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය කිරීම,
'වැස්ස' කවි පෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 15 යි)*

## අපේක්ෂිත උත්තර

(i) උපමා භාවිතය

- ❖ පිඹුරන් සේ ඇදෙයි ගුරු පැහැ දිය දරා
- ❖ දියවැල් වමාරන්නා මෙනි පියසි තල
- ❖ ගැබ්වුණු සිසිල එයි, ඊතල පරිදි මෙහේ
- ❖ ගී දේවියට කැප කළ දෙවොලකට සම
- ❖ කුටියක සුවඳ දෙයි කළුවැල් කපුරු දුම

(ii) අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය කිරීම

- ❖ ගස්වැල් තිගැස්සෙයි මේ කුළු ගැටෙන හඬින්
- ❖ පදමට වෙරළු මිණි කැට සුණු විසුළ හැඩ
  ජෝතිය ලැගුම් ගත් ළා තණ පිටිට් උඩ
- ❖ වැසි බිඳු ඇද වැටී කුර ගැටෙන හඬ දිදී
- ❖ ළා අතු රිකිලි, රුක්ගොමු, ලියමඬුලු ඉහේ
  දැඩි වේදනාවෙන් මිරිකී හඬනු ඇහේ
- ❖ ගන වැහි වළා ඉගිලී එන විට දී අඬා
- ❖ හදවත පියාඹා යයි වෙල් කුඹුරු උඩින්

*(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)*

***උදාහරණ සඳහා ලකුණු 04 යි***
***සමස්ත විස්තරයට ලකුණු 11 යි***
***මුළු ලකුණු 15 යි***

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංක 04**

4. (i) සරල භාෂා භාවිතයට සහ
 (ii) මනා අවස්ථා නිරූපණයට,
 තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් දැක් වූ දක්ෂතාව කාව්‍යශේඛරයෙන් පිළිබිඹු වෙයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

*(ලකුණු 15 යි)*

(i) සරල භාෂා භාවිතයට

- ➢ එකලෙක්තරා එ ක්
  දුක්පත් මහලු බමුණෙක් ......

- ➢ තිබූ දන එ දව ස
- ➢ පෙර අප දුන ඇඳින........

- ➢ දක්වාලා ඔහුට
  අත්පා මෙහෙ කිරීමට ..........

(ii) අවස්ථා නිරූපණය

මෙම කවි පන්තියේ ප්‍රධාන අවස්ථා හතරක් පෙන්වා දිය හැකිය. එනම්,

- ❖ බමුණා තම හිතවත් බමුණා ළඟ මුදල් තබා යෑමේ අවස්ථාව
- ❖ බමුණා නැවත පැමිණ මුදල් ඉල්ලූ අවස්ථාව
- ❖ මුදල් තබා ගත් බමුණා එම මුදල් දීම සඳහා උපාය යෙදූ අවස්ථාව
- ❖ මුදල් තබා ගිය බමුණාගේ උපාය සාර්ථක වූ අවස්ථාව

මෙම අවස්ථා හතරෙන් අවස්ථා දෙකක්වත් නිරූපණය වන සේ නිදසුන් සැපයීම ප්‍රමාණවත් ය.

**උදාහරණ**

- බමුණු එදහස ලත්
  බමුණු කුලයක පෙර දත් ........

WWW.OLEVELAPI.COM

- ඇවිදින් දද මහ ලු
  දැක ඒ කුලන් නිවහ ලු .........

- නුවෙන් අප අයැ ති
  පසු පෙය දෙන්ට මං නැ ති .......

  ණය කවුරු දන් දෙති
  සිලව් කොට ඒ යළි එකෙක් ඇති ......



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- වතින් සොමි සඳ වූ ........
- දක්වාලා ඔහු ට .......
- නොලදත් ඒ දහ ස
  සිදුවූ හෙයින් අදහ ස .......
- ඉත පූරුදු පෙර ක ල
  දූත් තොප මෙසේ කී කල .......

*(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.*
*එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)*

*උදාහරණ සඳහා ලකුණු 04 යි*
*සමස්ත විස්තරයට ලකුණු 11 යි*
*මුළු ලකුණු 15 යි*

**නැතහොත්**

'සද්ධර්මාලංකාරය,
(i) ශ්‍රව්‍ය ගෝචර රචනා ශෛලියක් යොදා ගනිමින්
(ii) චිත්තාකර්ෂණීය ලෙස වර්ණනා ඉදිරිපත් කරන කෘතියකි.
උත්තරෝලිය වස්තුවෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

(i) ශ්‍රව්‍ය ගෝචර රචනා ශෛලිය

කතුවරයා විසින් වර්ණිත වස්තු, අවස්ථා, සිදුවීම් හා චරිත නිරූපණයට, උපදෙස් දීම් ආදියට යෝග්‍ය අයුරින් ශ්‍රව්‍ය ගොචර ශෛලිය යොදා ඇත.

❖ සරල වැකි භාවිත කරමින් සිද්ධි නිරූපණය

උදා : ඒ නිධානය සියල්ලවුනට පෙනෙන සේ උතුරාලූ වැව් දිය පිට පෙරළී පෙරළී ඔබැ මොබැ දිවෙයි. සමහර විටෙකැ දියෙහි ගිලෙයි ඉපිලෙයි.

❖ කුමාරයාගේ ශිඎාග්‍රහණ කාලය ගැන කරන විස්තරයේදී තත්සම වචන මිශ්‍ර භාෂාවක් යොදා ගැනීම

WWW.OLEVELAPI.COM

උදා : පසුව ඒ කුමාරයන් මවු කුසින් බිහිව ක්‍රමයෙන් වැඩී ශිඎාග්‍රහණය කාලය සම්ප්‍රාප්ත විය. එකලැ මේ ලංකාද්වීපයෙහි මනුෂ්‍යයෝ ......

❖ උපදෙස් දෙන අවස්ථාවට යෝග්‍ය වන සේ භාෂාව යොදා ගැනීම

උදා : එම්බා, මේ ලෝකවාසී වූ අඥාන සත්ත්වයෝ විෂ නොවන දෙය විෂ යයි කියති. සැබෑ ......

❖ ධර්මය දේශනා කරන අවස්ථාවට ගැළපෙන ගැඹුරු වචන යොදා ගැනීම

උදා : යමෙක් ශීලාදී ගුණ ධර්මයන්ට පරම ප්‍රතිෂ්ඨාධාර වූ .....
මාතුගාම නැමැති උදකරාක්ෂසීන්ව වාසස්ථාන වූ ........



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ii) චිත්තාකර්ෂණීය ලෙස වර්ණනා කිරීම

උදා :

- ❖ ගොපලු මව පිළිණි වූ කටු අලය පුතාට දෙන අවස්ථාව
- ❖ කටු අලය රහතන් වහන්සේට පිළිගන්වන අවස්ථාව
- ❖ කාන්තාවක විසින් නිධානය ගැනීමට උත්සාහ කරන අවස්ථාව
- ❖ වැව අසලට රැස්වූ ගැමියන් නිධානය අයිති කර ගැනීමට උත්සාහ කරන අවස්ථාව
- ❖ වස්ත්‍රය පිළිබඳව අරගල විසඳීමට යාමේදී
  රාජ පුරුෂයන් හා රජු ඉදිරියෙහි නිධානයේ හැසිරීම දක්වා ඇති ආකාරය

*(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.*
*එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)*

***උදාහරණ සඳහා ලකුණු 04 යි***
***සමස්ත විස්තරයට ලකුණු 11 යි***
***මුළු ලකුණු 15 යි***

★ 5,6,7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන 100 ක් පමණ තිබීම සෑහේ.

## ප්‍රශ්න අංක 05

5. මිනිසුන් දුප්පත්කමින් පීඩාවට පත් වීම නිරූපණය කිරීමේ දී කතුවරයා දක්වා ඇති සංවේදිතාව කෙබඳු වූවක් දැයි 'පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා' කෙටිකතාවෙන් උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

## අපේක්ෂිත උත්තරය

රාසුල් ජුබාබුජී අතර ඇතිවන සංවාදවලදී දුප්පත්කමින් පීඩාවට පත්වන මිනිස්සු නිරූපණය වෙති. එබඳු අවස්ථා තුනක් දක්වා තිබීම ප්‍රමාණවත්ය. යෝග්‍ය අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- ❖ දුප්පත් මිනිසෙකුට මේ ලෝකේ කිසිම හව්වරණක් නෑ බාබුජී
- ❖ ඒ කියන්නේ එදාට අපේ ගෙදර සේරම බඩගින්නේ කියන එකයි.
- ❖ මලානික කම්මුල් මත තැවරී තිබුණ කුණු කට්ටුව වුව ....
- ❖ තමුසෙගේ බඩගෙඩිය ඇතුළෙ තියෙන ගින්දරට කන්ඩ දෙන්ඩ දවසකට කොච්චර ඉන්ධන එකතු කරනවද?
- ❖ මගේ සිත රිදවන්නේ සූරාකනු ලබන නිර්ධන පන්තියේ එකකු විසින්ම ....
- ❖ ඇයි තමුසෙට ඒක මදිද? මීට වඩා පයිසයක්වත් තමුසෙට දෙන්න බෑ.

දුප්පත්කමින් පීඩාවට පත්වී ඇති මෙබඳු මිනිසුන් අනුන්ගේ කරුණාවට පාත්‍රවිය යුතු බව ද ලේඛකයා හඟවයි. එමගින් දුප්පත් අසරණයින්ගේ මානසික තත්ත්වය හෙළි කරයි.

*(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.)*

***උදාහරණ සඳහා ලකුණු 03 යි***
***සමස්ත විස්තරයට ලකුණු 07 යි***
***මුළු ලකුණු 10 යි***

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## ප්‍රශ්න අංක 06

6. අවුරුදු සමයේ දක්නට ලැබෙන පරිසරය විචිත්‍ර ලෙස වර්ණනා කිරීම, 'වසන්ත සමය' කවිපන්තියේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය උදාහරණ තුනක් දක්වමින් විමසන්න. *(ලකුණු 10 යි)*

## අපේක්ෂිත උත්තරය

අවුරුදු සමය විචිත්‍ර ලෙස වර්ණනා කිරීමට කවියා පරිසරයේ විවිධ අංශ ගැන අවධානය යොමු කරයි.

i. ස්වභාව සෞන්දර්යය

❖ මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී
මී වදවල පැණි පූරවන්නී ....

❖ ජම්බු ගහට රත පොරවන්නී
බක් මී ගහ කහ අන්දන්නී

❖ එරබදු පැහැයෙන් දුලවන්නී
නා ගස් සුවඳින් බැඳලන්නී .....

❖ ගමේ මැ පුහුලන් ඉදවන්නී
සොරුන් බවට වවුලන් ලන්නී .......

ii. සමාජ පරිසරය

❖ මල්සර හට හී සපයන්නී
යොවුනන් සිත් ඉන් බැඳලන්නී ........

❖ වෙන් වූවන් සිත කළඹන්නී
පැරණි තරහ හැම යට ලන්නී.......

❖ දස දෙස සුවඳින් බැඳැලන්නී
ගතට සිතට තාව පණ දෙන්නී

iii. ගෙදර දොර පරිසරය

❖ කොල්ලන් කෙල්ලන් පොබයන්නී
මහලු සිතෙත් කෙළි රිසි ලන්නී .....

(පොදුවේ උදාහරණ තුනක් සහිතව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

*උදාහරණ සඳහා ලකුණු 03 යි*
*සමස්ත විස්තරයට ලකුණු 07 යි*
*මුළු ලකුණු 10 යි*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ප්‍රශ්න අංක 07**

7. 'ජීවක කථා වස්තුව, යහපත් වෛද්‍යවරයකුගේ ගුණාංග ඉස්මතු කර දක්වන නිර්මාණයකි.' උදාහරණ තුනක් දක්වමින් පහදන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත උත්තරය**

❖ වෛද්‍ය ශාස්ත්‍රයෙහි කිසි අඩුවක් නැතිව කෝටි ප්‍රාප්ත වීම

යහපත් වෛද්‍යවරයෙකුගේ ගුණාංග ඉස්මතු වන ආකාරය දක්වෙන අවස්ථා

"මේ ~~සිපිණ~~ ලොව නම් පූර්වයෙහි ඖධයෙන්ම මවන ලද වන. ඖෂධ සටිකාවක් වැන්න. ඖෂධයකට නොගත හැකි වස්තුවක් නොලද්දෙමි."

❖ රෝගියා තුළ විශ්වාසය ඇති කිරීම. හිස රුජාවෙන් පෙළුණු සිටාණන් සුවකළ හැකි බව තරයේ ම කීම

❖ නිවැරදි ලෙස රෝග නිශ්චය කිරීම

සිටාණ කෙනෙකුන්ගේ ශීර්ෂාබාධය - මත්ලුංගභෝජක පණුවන් දෙදෙනා දැකීම.

"නුඹ ඉස මත්ලුංගභෝජක නම් පණුවෝ දෙදෙනෙක් අටගත්හ ..." බාරාණසෙය්‍යක

සිටාණන්ගේ පුතාගේ අන්තර්ගණ්ඨි ආබාධය

"නුඹ වහන්සේ බඩ ගැට ~~ගෙණ~~ ගෙන ගුණයෙක් ඇද්දැයි ..."

❖ රෝගීන්ට ධන හානි නොකිරීම

සිටු දේවියගේ ශීර්ෂාබාධ අවස්ථාව

"තෙල රුජාව සංසිඳුවා මිස නොයමි. වැලි ධන හානියකුත් නොකරමි."

❖ මුදලට සම්පත්වලට වඩා මිනිස් ගුණාංගවලට ගරු කිරීම.

"නුඹ වහන්සේගෙන් කරුණා සම්පත් දෙවාවදාළ මැනව"

*(නිදසුන් 3 ක් ඉදිරිපත් කරමින් කරුණු දක්වීම ප්‍රමාණවත් ය. ගැළපෙන වෙනත් නිදසුන් ද පිළිගන්න.)*

*උදාහරණ සඳහා ලකුණු 03 යි*
*සමස්ත විස්තරයට ලකුණු 07 යි*
*මුළු ලකුණු 10 යි*



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....